සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# පෙරදිග සංගීතය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශුද්ධ ස්වර වලින් යුක්ත රාග යුගලය වන්නේ,
    (1) කාෆි භූපාලි (2) බිලාවල් භූපාලි (3) භූපාලි කාෆි (4) භූපාලි යමන්

02. |ග ම රි |ග ප ධ නි |සං නි ධ |ප ප ග ප |මෙම ස්වර පාදය අයත් රාගය ලෙස නම් කළ හැක්කේ,
    (1) භූපාලි (2) යමන් (3) කාෆි (4) බිලාවල්

03. පහත සඳහන් තාල අතරින් මාත්‍රා තුනෙහි තාලය (හින්දුස්ථානි) වන්නේ,
    (1) දාදරා (2) ත්‍රිතාලය (3) කෙහෙර්වා (4) මැදුම් තනි තිත

04. ත්‍රිතාලයේ යෙදෙන මාත්‍රා ගණන,
    (1) 6 කි. (2) 8 කි. (3) 16 කි. (4) 12 කි.

05. |ප ප ම ම |ග ග රි රි |ස රි ග ම |ප |මෙම ස්වර පාදයට අදාළ සරල ගීතය නම්,
    (1) ඕලු පිපීලා විල ලෙලදෙනවා (2) දියගොඩ සැමතැන කිරි ඉතිරේ
    (3) මිහිකත නලවාලා (4) කිරි සුදු හාවා පැන පැන ආවා

- **අංක 06 - 10 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු දී ඇති වරහන තුළින් තෝරා හිස්තැන පුරවන්න.**

(මාත්‍රා, බලිය, ඒකාව, සමග්‍රහය, බෙරපදය, තිත්, තෙයි, බලිය)

තාලයක කුඩාම ඒකකය (06) .............................. යි. මාත්‍රා කිහිපයක් එක්වීමෙන් (07) .............................. සෑදේ. හින්දුස්ථානි තාලයක එන තබ්ලා පදය (08) .............................. නම් වේ. මැදුම් තනි තිත සඳහා යෙදෙන තිත් සංඛ්‍යාව (09) .............................. වේ. හින්දුස්ථානි තාලයක එන ප්‍රබල ස්ථානය (10) .............................. යි.

The National e-Learning Portal for The General Education

11. හින්දුස්ථානි සංගීතයේ ස්ථායි කොටසට සමාන වන සරල ගීත ආකෘතියේ දැක්වෙන කොටස නම්,
    (1) Interlude (2) Verse (3) Chorus (4) Introduction

12. පහත සඳහන් භාණ්ඩ අතරින් ස්වර පර්දා පිහිටා නොමැති භාණ්ඩය වන්නේ,
    (1) වයලීනය (2) සිතාරය (3) එස්රාජය (4) වීණාව

13. නූර්ති නාට්‍ය හා සම්බන්ධ කියමන නොවන්නේ,
    (1) උතුරු ඉන්දියානු සංගීතයේ ආභාෂය ලැබී ඇත.
    (2) තබ්ලාව ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
    (3) තංගපාට, තිර්ලානා වැනි තාල යොදා ගනී.
    (4) කන්කළු ගීත වලින් යුක්ත වේ.

14. පහත සඳහන් බටහිර ස්වර සංකේත තුළින් මාත්‍රා 2 ක වටිනාකම පෙන්නුම් කරනු ලබන්නේ,
    (1) 𝅗𝅥. (2) 𝅝 (3) 𝅗𝅥. (4) ♩

15. 'කොබෝ කුරුළු වනේ' මෙම ගී පාදයේ ලඝු ගුරු අක්ෂර පිළිවෙලින්,
    (1) ල. 2, ගු. 5 (2) ල. 6, ගු. 1 (3) ල. 5, ගු. 2 (4) ල. 2, ගු. 4

- **කෙටි පිළිතුරු සපයන්න.**

16. උඩරට වන්නම් ගණන කීයද? ..........................................................................................
17. භූපාලි රාගයේ වාදි සංවාදි ස්වර පිළිවෙලින් ලියන්න. .............................................................
18. නාඩගම් නාට්‍ය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ 02 ක් ලියන්න. ............................................
19. සර්ගම් යනු කෙටියෙන් හඳුන්වන්න. ..........................................................................................
20. තබ්ලාවේ බායාං කොටසින් උපදිනා අක්ෂර 02 ක් ලියන්න. ........................................................

## II - කොටස

- **ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන්ව ඇත්තේ නිර්දේශිත මධ්‍යලය ගීත 03 ක ආරම්භක ස්වර කොටස් 03 කි.

(a) ග රි ග රි | ස රි ස ධ (b) ග රි ග ප | නි ධ නි (c) ස ස රි රි | ග ග ම ම්

i. ඉහත a, b, c යන ස්වර කොටස් වලට අයත් රාග හඳුන්වන්න. (ල.03)

ii. (b) කොටසට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.03)

iii. (c) කොටසට අයත් රාගයේ ආරෝහණ, අවරෝහණ, වාදි, සංවාදි, මුඛ්‍යාංගය, ගානසමය ලියා දක්වන්න. (ල.04)

(02) i. තබ්ලාවෙන් වාදනය කරන මාත්‍රා 16 තාලය තාලය මූලධර්ම සහිතව ප්‍රස්තාර කරන්න. (ල.04)

ii. දේශීය තිත් ක්‍රමයේ එන තිත් සංඥා සංකේත සහිතව ලියා දක්වන්න. (ල.02)

iii. මාත්‍රා 4 න් 4 යෙදෙන තිත නම් කර එය ප්‍රස්තාර කරන්න. (ල.04)

(03)

| A | B |
| --- | --- |
| මෝරා බීජයෙනා | චන්දනන් යස තේජ කුංකුම |
| කලපත් දෙකඩත් කලසිත් | ඇන්ද දිග ගනන් උරතල |
| තුටුවෙත් | මින්ද සතුරු අඳුරු පැහැර |
| දෙන්නා අදර තොසා | බන්දු කමල සේ |

i. ඉහත A සහ B කොටස් වලට අයත් ගීත හඳුන්වන්න. (ල.02)

ii. එම A සහ B කොටස් වල ගීත විශේෂ පිළිබඳ කරුණු 04 බැගින් වෙන වෙනම ඉදිරිපත් කරන්න. (ල.04)

iii. වන්නම් ඇසුරු කර ගනිමින් නිර්මාණය වූ සරල ගීතයක් නම් කර එම ගීතය ලියා දක්වන්න. (ල.04)

(04) i. පහත සඳහන් ගී පාද වල සඳැස්මත් ගණන සොයන්න.

(a) මොර හිඹුටු දම් පනා

(b) එක පඳුරෙන් ලී සයක් කපාගෙන

(c) බෝ අත්තට වැඳ සිරස නමන්නේ

(d) ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට

(e) ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ (ල.05)

ii. සඳැස්මත් ගීමත් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.03)

iii. 'මොර හිඹුටු දම් පනා
අඹ දඹද ඇට බිනා' යන ගීතයේ ගීමත් ගණනය කර දක්වන්න. (ල.02)

(05) i. බටහිර සංගීතයට අනුව ට්‍රෙබල් ක්ලෙෆ් හි (Treble Clef) රේඛාවන් තුළ ස්වර පිහිටන අයුරු ඇඳ දක්වා එම රේඛාවන් තුළ යෙදෙන ස්වර නම් කරන්න. (ස්වර පිහිටන ආකාරය දැක්වීමට සෙමිබ්‍රිව් සංකේතය (*O*) යොදා ගන්න.)

ii. ට්‍රෙබල් ක්ලෙෆ් එක පමණක් භාවිත කර මධ්‍ය ස සිට උච්ච ස ආරෝහණ පිළිවෙල මෙම *O* සෙමිබ්‍රීව් සංකේතය යොදා ගනිමින් ලකුණු කරන්න.